# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පෙරහුරු පරීක්ෂණය - 2020
# General Certificate of Education (Adv. Level) Examination - Practice Test - 2020

ශ්‍රී ලංකා ඉතිහාසය I ( I කොටස)
History of Sri Lanka I (Part I)

25 | S | I

කාලය : පැය තුනයි
Time : Three hours

**සැලකිය යුතුයි.**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරන්න. කාලය පැය 3යි. අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.**

---

- **අංක 01 සිට 10තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම කුමක් දැයි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.**

1. **(1)** පාහියන්ගල **(2)** රාවණාඇල්ල **(3)** රිටිගල **(4)** පොම්පරිප්පු **(5)** බටදොඹලෙන (.....)

2. **(1)** කළු ගඟ **(2)** මහවැලි ගඟ **(3)** අඹන් ගඟ **(4)** වලවේ ගඟ **(5)** කැලණි ගඟ (.....)

3. **(1)** ඔනෙසික්‍රිටස් **(2)** මෙගස්තිනීස් **(3)** ප්ලිනි **(4)** කොස්මස් **(5)** වෙං හෝ (.....)

4. **(1)** සේන-ගුත්තික **(2)** අසේල **(3)** එළාර **(4)** බුද්දපාරින්ද **(5)** මාඝ (.....)

5. **(1)** අඹගමුව සෙල්ලිපිය **(2)** දඹුල්ල පර්වත ලිපිය **(3)** වාඳුරුප්ප සෙල්ලිපිය **(4)** රඹෑව පුවරු ලිපිය **(5)** රන්කොත් විහාර ටැම් ලිපිය. (.....)

6. **(1)** ශංකිලි **(2)** පුවිරාජ පණ්ඩාරම් **(3)** පෙරියපිල්ලෙෙ **(4)** අරිට්ට කීවෙණ්ඩු පෙරුමාල් **(5)** එදිරිමාන සංහම් (.....)

7. **(1)** දන්තුරේ සටන **(2)** වෙල්ලස්ස සටන **(3)** බලන සටන **(4)** රන්දෙනිවල සටන **(5)** ගන්නෝරු සටන (.....)

8. **(1)** රොබට් බ්‍රවුන්රිග් **(2)** එඩ්වඩ් බාන්ස් **(3)** චාල්ස් කැමරන් **(4)** ජෝර්ජ් ඇන්ඩර්සන් **(5)** ඇන්ඩෘ කැල්ඩිකොට් (.....)

9. **(1)** ආනන්ද විද්‍යාලය **(2)** ධර්මරාජ විද්‍යාලය **(3)** රාජකීය විද්‍යාලය **(4)** හින්දු විද්‍යාලය **(5)** සඟිරා විද්‍යාලය (.....)

10. **(1)**කෝල්බෲක් **(2)** මෝර්ගන් **(3)** මැනිං-ඩෙවොන්ෂයර් **(4)** ඩොනමෝර් **(5)** සෝල්බරි (.....)

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත.ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැලපේ. එම නොගැලපෙන යුගලය කුමක් දැයි හඳුනාගෙන, ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුල ලියන්න.**

11. **(1)** මල්වතු ඔය - නාච්චදූව වැව **(2)** කලා ඔය - කලා වැව
**(3)** දැදුරු ඔය - යෝධ වැව **(4)** යාන් ඔය - හුරුළු වැව
**(5)** කනගරායන් ආරු - ඉරණමඩු වැව **(.....)**

12. **(1)** කාකවණ්ණ තිස්ස රජ - විහාරමහාදේවි **(2)** කූටකණ්ණ තිස්ස රජ - අනුලා දේවි
**(3)** පළමුවැනි විමලධර්මසූරිය රජ - කුසුමාසන දේවිය **(4)** පළමුවැනි විජයබාහු රජ - තිලෝකසුන්දරි
**(5)** ශ්‍රී වික්‍රම රාජසිංහ රජ - වෙන්කට රංගම්මා **(.....)**

13. **(1)** ජානකීහරණය - කුමාරදාස රජතුමා **(2)** කව්සිළුමිණ - දෙවන පරාක්‍රමබාහු රජතුමා
**(3)** සද්ධර්මරත්නාවලිය - ධර්මසේන හිමි **(4)** රසවාහිනිය - වේදේහ හිමි
**(5)** සිදත් සඟරාව - ගුරුළුගෝමී **(.....)**

14. (1) මුල්ලේරියා සටන - ලොරෙන්සෝද අල්මේදා **(2)** දන්තුරේ සටන - පේද්‍රෝ ලෝපෙස් ද සූසා
**(3)** බලන සටන - දොන් ජෙරොනිමෝ ද අසවේදු
**(4)** රන්දෙනිවල සටන - කොන්ස්තන්තීනුද සා ද නොරොඤ්ඤා
**(5)** ගන්නොරු සටන - දියෝගු ද මෙලෝ ද කැස්ත්‍රෝ **(.....)**

15. **(1)** වලානේ සිද්ධාර්ථ හිමි - පරම ධම්ම චේතිය පිරිවෙන
**(2)** ආරුමුග නාවලර්තුමා - වන්නාර්පන්නෙයි සයිව ප්‍රගාස විද්‍යාලය
**(3)** හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි - විද්‍යොදය පිරිවෙන
**(4)** රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමි - විද්‍යාලංකාර පිරිවෙන
**(5)** ටී.බී ජයා - සහිරා විද්‍යාලය **(.....)**

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම /ප්‍රකාශන/දින වකවානු සමූහයක් X හා Y තීරුවල දී ඇත. Yතීරුවේ දී ඇති නාම /ප්‍රකාශන/දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. Yතීරුව X. තීරුව සමඟ ගැළපෙන අනු පිළිවෙළකට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය එම සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.**

16.

| X | Y |
|---|---|
| **(1)** ටැම් ලිපිය | A පනාකඩුව |
| **(2)** ගිරි ලිපිය | B හෝපිටිගමුව |
| **(3)** පුවරු ලිපිය | C දඹදෙණිය |
| **(4)** කතිකාවත | D දැදිගම |
| **(5)** සන්නස | E අම්පිටිය |

(1) BADEC (2) BAEDC (3) BDCEA (4) BDECA (5) BEDCA **(.....)**

17.

| X | Y |
|---|---|
| **(1)** ටොලමි | A රෝමයට ගිය ශ්‍රී ලංකා දූත මෙහෙවර ගැන |
| **(2)** ප්ලිනි | B ශ්‍රී ලංකාවේ ප්‍රථම භූ සිතියම |
| **(3)** පාහියන් | C ලංකාවේ අභ්‍යන්තර හා බාහිර වෙළදාම ගැන |
| **(4)** ඉබන් බතූතා | D යාපන රාජ්‍ය පිළිබඳ |
| **(5)** කොස්මස් | E අභයගිරි විහාරය පිළිබඳ |

**(**1) BEDCA (2) BDECA (3) BDCEA (4) BAEDC (5) BADEC **(.....)**

18. X Y

| X | Y |
|---|---|
| **(1)** මහ බද්ද | A අලි ඇතුන් පිළිබඳ කාර්යංශය |
| **(2)** කොට්ටල් බද්ද | B විවීම් පිළිබඳ කාර්යංශය |
| **(3)** කුරුවේ බද්ද | C ප්‍රවාහන කාර්යංශය |
| **(4)** මඩිගේ බද්ද | D කුරුඳු දෙපාර්තමේන්තුව |
| **(5)** කින්නර බද්ද | E ශිල්පීන් පිළිබඳ කාර්යංශය |

(1) EDABC (2) DEACB (3) CBDAE (4) CDAEB (5) BEADC **(.....)**

19. X Y

| X | Y |
|---|---|
| **(1)** සිල්වත් සමාගම | A එච්.එස්. ඕල්කට් |
| **(2)** සයිව ප්‍රගාශ සබෙයි | B වැලිවිට සරණංකර හිමි |
| **(3)** බෞද්ධ පරමවිඥානාර්ථ සමාගම | C ඩී.බී.ජයතිලක |
| **(4)** මහා බෝධි සමාගම | D අනගාරික ධර්මපාලතුමා |
| **(5)** තරුණ බෞද්ධ සංගමය | E ආරුමුග නාවලර් තුමා |

**(1)** EDABC (2) DEACB (3) CBDAE (4) CDAEB (5) BEADC **(.....)**

20. X Y

| X | Y |
|---|---|
| **(1)** පොල්ගස් වලට බද්දක් පැනවීම | A **1883** කොටහේන කෝලාහලය |
| **(2)** හජ්ජි මරික්කාර් මඩිගේ මුහන්දිරම් තනතුරට පත්කිරීම | B **1817-18** බ්‍රිතාන්‍ය විරෝධි අරගලය |
| **(3)** මාර්ග බද්ද හඳුන්වාදීම | C **1797-98** ජනතා නැගී සිටීම |
| **(4)** බෞද්ධ පෙරහැරට පහරදීම | D **1848** බ්‍රිතාන්‍ය විරෝධි අරගලය |
| **(5)** වල්ලාහගොඩ දේවාල පෙරහැර අවහිර කිරීම | E **1915** කෝලාහලය |

**(1)** EDABC (2) DEACB (3) CBDAE (4) CDAEB (5) BEADC **(.....)**

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. ජේතවනාරාමය :
   **(1).** ජේතවනාරාමය මහසෙන් රජතුමා විසින් කරන ලදි.
   **(2).** ජේතවනාරාමය මහාවිහාර සීමාව තුළ පිහිටුවන ලදි.
   **(3).** සාගල භික්ෂුවට ජේතවන විහාරය පූජා කරන ලදි.
   **(4).** ජේතවන දාගැබ ශ්‍රී ලංකාවේ විශාලතම ස්තූපය කරගෙන ආරම්භ විය.
   **(5).** ජේතවන නිකාය,ජේතවන විහාරය කේන්ද්‍ර කරගෙන ආරම්භ විය. **(.....)**

22. පළමුවන විජයබාහු රජතුමා :
   **(1).** පළමුවන විජයබාහු රජතුමා කුඩා කාලයේ කිත්ති කුමාරයා නමින් හැදින්විය.
   **(2).** බුද්ධරාජ නම් ජන ප්‍රධානියකු පළමුවන විජයබාහු රජතුමාට ආධාර කළේය.
   **(3).** චෝළයන් ශ්‍රී ලංකාවෙන් පළවා හැර ,පළමුවන විජයබාහු රජතුමා දිවයින එක්සේසත් කළේය.
   **(4).** පළමුවන විජයබාහු රජතුමා රාමඤ්ඤ දේශය ආක්‍රමණය කලේය.
   **(5).** පළමුවන විජයබාහු රජතුමා පොළොන්නරුව සිය අගනගරය කර ගත්තේය. **(.....)**

23. කෝට්ටේ නගරය :

**(1).**නිශ්ශංක අලගක්කෝනක්කෝණාර විසින් ගොඩනගන ලද බල කොටුවක් ලෙස කෝට්ටේ නගරය ආරම්භ විය.

**(2).** කෝට්ටේ, ශ්‍රී ජයවර්ධනපුරය යනුවෙන් ද හැඳින්විය.

**(3).**හයවන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේදී දිවයිනේ අගනගරය ලෙස කෝට්ටේ නගරයේ වර්ධනය එහි ඉහලම හිණිපෙත්තටම ලගා විය.

**(4).** ධර්මපාල **1551** දී කෝට්ටේ රජු බවට පත් විය.

**(5). 1565** දී ලන්දේසින් විසින් කෝට්ටේ නගරය අල්ලා ගන්නා ලදි. **(.....)**

24. කෝල්බෲක් යෝජනා :

(1). ආණ්ඩුකාරවරයාගේ බලතල අඩුකිරීම.

(2). ව්‍යවස්ථාදායක හා විධායක සභාවක් පිහිටුවීම.

(3). රාජකාරිය අවලංගු කිරීම.

(4). ඒකීය අධිකරණ ක්‍රමයක් ඇති කිරීම.

(5). මුළු දිවයිනම පළාත් නවයකට බෙදීම. **(.....)**

25. පොන්නම්බලම් අරුණාචලම් :

**(1).** විශිෂ්ට සිවිල් සේවකයෙක් විය.

**(2).** දේශපාලන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් විශාල උන්නඳුවක් දැක්විය.

**(3).** විශ්වවිද්‍යාලයක් පිහිටුවීම සඳහා උද්ඝෝෂණයක් කළේය.

**(4).** යාපනයේ හින්දු විද්‍යාලය පිහිටුවීම.

**(5).** ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා විය. **(.....)**

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (A), (B), (C) හා (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවරදිය. නිවරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරන්න.

  (A) සහ (B) පමණක් නිවරදි නම් ...............................................**1** ද,

  (B) සහ (C) පමණක් නිවරදි නම් ...............................................**2** ද,

  (C) සහ (D) පමණක් නිවරදි නම් ...............................................**3** ද,

  (A) සහ (C) පමණක් නිවරදි නම් ...............................................**4** ද,

  ප්‍රතිචාර එකක් හෝ දෙකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවරදි නම් .....**5** ද වරහන් තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** හා **(B)** පමණක් නිවරදිය | **(B)** හා **(C)** පමණක් නිවරදිය | **(C)** හා **(D)** පමණක් නිවරදිය | **(A)** හා **(C)** පමණක් නිවරදිය | ප්‍රතිචාර එකක් හෝ දෙකට වැඩි සංඛ්‍යාවක් නිවරදිය |

26. මෝරිය වංශය හා සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?

A - මෝරිය පෙළපතේ ප්‍රභවය අප්‍රකටය.

B - පශ්චාත්කාලීන සම්ප්‍රදායන්හි මොවුන් ඉන්දියාවේ මෞර්ය අධිරාජ්‍යයන් සමග සම්බන්ධ කර ඇත.

C - මෝරිය වංශයට කෙළින්ම සම්බන්ධ අන්තිම රජු වූයේ වසභය.

D - පොළොන්නරු යුගය අවසානය දක්වා ම මෞර්ය රාජවංශය විසින් ශ්‍රී ලංකාව පාලනය කරන ලදි. **(.....)**

27. ශාසන ඉතිහාසයෙහි ලා මහසෙන් රාජ්‍ය සමය වැදගත් වන්නේ පහත සඳහන් කවර ප්‍රතිචාරය/ප්‍රතිචාර නිවැරදිද?

A - වෛතුල්‍යවාදය හඳුන්වා දීම.

B - අනුරාධපුරයේ විශාලතම ස්තූපය ඉදිකිරීමේ ගෞරවය හිමි වීම.

C - අභයගිරි දාගැබ ඉදිකිරීම.

D - ථෙරවාද බෞද්ධ ත්‍රිපිටකය ලක්දිවට ගෙන ඒම. **(.....)**

28. යාපන රාජධානියේ ඉතාහාසය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවරප්‍රකාශ/ප්‍රකාශය නිවැරදි වේද?

A - යාල්පානම් වෛපවමාලෛ සහ ශේගරාශශේකර මාලෛ යාපන රාජධානියේ ඉතිහාසය හැදෑරීමට ඇති ප්‍රධාන මූලාශ්‍රය දෙකකි.

B - විජය කුලංගෛ යාපන රාජ්‍යයේ ප්‍රථම පාලකයා ලෙස සැලකේ.

C - යාපනයේ මුල් රජවරු, චෝල අධිරාජ්‍යයේ සාමන්ත පාලකයෝ වූහ.

D - **1617** දී පරරාජසේකරම් මරා දමා පෘතුගීසිහු යාපනය රාජධානිය අත්පත්කර ගන්නා ලදි. (.....)

29. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා,

A - ශ්‍රී වික්‍රමරාජසිංහ රජතුමා උඩරට රාජධානියේ අවසාන පාලකයා විය.

B - උඩරට සිංහාසනයට පත්වීමට පෙර ශ්‍රී වික්‍රමරාජසිංහ රජතුමා, කන්නසාමි නම් විය.

C - ඔහු සිහසුනේ තැබීමට පිළිමතලාවේ මහාධිකාරම් මූලිකත්වය ගත්තේය.

D - ශ්‍රී වික්‍රමරාජසිංහ රජතුමා පත්තිරිප්පුව ඉදි කරවීය. (.....)

30. **1972** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?

A - අග්‍රාණ්ඩුකාරවරයා නාමික විධායකය ලෙස හැඳින්වීම.

B - සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වාදීම

C - ඒකමණ්ඩල ව්‍යවස්ථාදායකයක් පිහිටුවීම.

D - ජනතා පරමාධිපත්‍ය පිළිගනු ලැබීම. (.....)

- අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

31. ලම්භකර්ණ පෙළපතේ පළමුවන පාලකයා කවුද?

**(1)** සුභ **(2)** වසභ **(3)** ගජබාහු **(4)** ගෝඨාභය **(5)** ධාතුසේන (.....)

32. නිශ්ශංකමල්ල රජතුමා මුහුණ දුන් අභියෝග කවරේද?

**(1)** චෝළ ආක්‍රමණය **(2)** ගොවි වංශිකයන්ගේන් එල්ලවූ අභියෝග

**(3)** තීය බ්‍රාහ්මණයාගේ කැරැල්ල **(4)** යාපන පාලකයන්ගෙන් එල්ල වූ තර්ජන

**(5)** චන්ද්‍රබානුගේ ආක්‍රමණය (.....)

33. යාපහුව රාජධානයේ පළමුවන පාලකයා කවුද?

**(1)** තුන්වැනි විජයබාහු රජතුමා **(2)** දෙවැනි පරාක්‍රමබාමහු රජතුමා

**(3)** පළමුවන බුවනෙකබාහු රජතුමා **(4)** තුන්වැනි පරාක්‍රමබාහු රජතුමා

**(5)** දෙවැනි බුවනෙකබාහු රජතුමා (.....)

34. විද්‍යාලංකාර පිරිවෙන පිහිටුවන ලද්දේ කවරෙකු විසින්ද?

**(1)** හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි **(2)** මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි

**(3)** රත්මලානේ ධර්මාලෝක හිමි **(4)** වැලිවිටියේ සෝරත හිමි

**(5)** වලානේ සිද්ධාර්ථ හිමි (.....)

35. ශ්‍රී ලංකාවේ අග්‍රාණ්ඩුකාර ධුරයට පත් ප්‍රථම ලාංකිකයාගේ නම කුමක්ද?

**(1)** ඩී.එස් සේනානායක මහතා **(2)** ජෝන් කොතලාවල මහතා

**(3)** ඔලිවර් ගුණතිලක මහතා **(4)** එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක මහතා

**(5)** විලියම් ගොපල්ලව මහතා (.....)

- අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.

| | පළමු වැනි ප්‍රකාශය | දෙවෙනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | වැරදි ය. |
| 2 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |
| 5 | නිවැරදි ය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 36. දීපවංශයට ලියන ලද ටීකාව විසුද්ධිමග්ග නමින් හැඳින්වේ. | සිරිමේඝවණ්ණ රාජ්‍ය සමයේදී දන්ත ධාතූන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කරවනු ලැබීය. (.....) |
| 37. පළමුවන පරාක්‍රමබාහු රජතුමා විසින් කරවන ලද පරාක්‍රම සමුද්‍රය පුරාණ ශ්‍රී ලංකාවේ එතෙක් නිර්මාණය කරන ලද විශාලතම වැව වේ. | පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ රාජ්‍ය සමය පැරණි ශ්‍රී ලංකාවේ ජල ඉංජිනේරු කාර්ය සාඵල්‍යයේ කූටප්‍රාප්තිය සලකුණු කරයි. (.....) |
| 38. ගම්පොළ රාජධානියේ ආරම්භකයා හතරවන බුවනෙකබාහු රජුය. | යාපනයේ ආර්යචක්‍රවර්ති ගම්පොළ රාජධානියට අයත් ප්‍රදේශ වලින් බදු අය කළේය. (.....) |
| 39. හයවැනි පරාක්‍රමබාහු රජතුමා වෙං හෝ පරාජයට පත්කොට ශ්‍රී ලංකාව එක්සේසත් කළේය. | පෘතුගීසි පාලනයෙන් උද්ගත වූ වඩාත් කැපීපෙනෙන ප්‍රතිඵලය වූයේ රෝමානු කතෝලික ආගම හඳුන්වාදීමයි. (.....) |
| 40. ජාතිමූල නියෝජන ක්‍රමය අවලංගු කිරීමට ඩොනමෝර් කොමිසම යෝජනා කළේය. | නාමික විධායකයක් සහිත ද්වි මණ්ඩල ව්‍යවස්ථාදායකයක් ඩොනමෝර් කොමිසම විසින් යෝජනා කරන ලදි. (.....) |

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පෙරහුරු පරීක්ෂණය - 2020

General Certificate of Education (Adv. Level) Examination - Practice Test - 2020

ශ්‍රී ලංකා ඉතිහාසය I ( II කොටස)
History of Sri Lanka I (Part II)

25 S I

**සැලකිය යුතුයි.**

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **B හා C කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න එක බැගින් තෝරාගෙන ප්‍රශ්න තුනකට ද පිළිතුරු සපයන්න. (පළමුවන ප්‍රශ්නයට පිළිතරු සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ දළ සිතියමක් සපයා ඇත.)**

**A කොටස**

01. **ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම කරන්න.**

**1.** නැගෙනහිර පළාත **2.** පොළොන්නරුව **3.** කදම්බ නදි **4.** මල්වාන
**5.** හම්බන්තොට **6.** කල්පිටිය **7.** කලාවැව **8.** සේනානායක සමුද්‍රය
**9.** කොළඹ **10.** පාහියන්ගල **11.** නාච්චදූව වැව **12.** බදුල්ල

**(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි)**

**B කොටස**

02. **අනුරාධපුර යුගයේ අවසානය දක්වා ලංකාවේ ඉතිහාසය හැදෑරීමේදී පාලි වංශකථා වලින් ලැබෙන තොරතුරු පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර වලින් හෙළිවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 16)**

03. i. **වට්ටගාමිණී අභය රජුට මුහුණ දීමට සිදුවූ අභියෝග කවරේද? (ලකුණු 8)**
ii. **ඔහු එම අභියෝග ජයගත් ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 8)**

04. **ක්‍රි.පූ 3 වන සියවසයේ සිට ක්‍රි.ව 6 වන සියවසය දක්වා වාරිමාර්ග ක්‍රමය වර්ධනය වූ ආකාරය පහත සඳහන් ශීර්ෂ යටතේ පරීක්ෂා කරන්න.**
- **වැව් හා ඇළමාර්ග තැනීමේලා රජවරුන් ඉටු කළ කාර්යභාරය**
- **වාරි තාක්ෂණය**

05. **"මහා පරාක්‍රමබාහු රජුගේ අනුප්‍රාප්තිකයන් අතුරෙන් පොළොන්නරුවේ වැදගත්ම පාලකයා නිශ්ශංකමල්ල රජුය"**
i. **නිශ්ශංකමල්ල රජුගේ රාජවංශය නම් කරන්න. (ලකුණු 03)**
ii. **නිශ්ශංකමල්ල රජු විසින් කරවන ලද ගොඩනැගිලි තුනක් නම් කරන්න. (ලකුණු 03)**
iii. **නිශ්ශංකමල්ල රජුට තිබූ අභියෝග මොනවාද? (ලකුණු 04)**
iv. **"මහා පරාක්‍රමබාහු රජුගේ අනුප්‍රාප්තියන් අතරින් පොළොන්නරුවේ වැදගත්ම පාලකයා නිශ්ශංකමල්ල රජුය" යන කියමන විචාරාත්මකව විමසන්න. (ලකුණු 08)**

06. **පහත දැක්වෙන මාතෘකා අතුරෙන් දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.**
i. දඹදෙණි යුගයේ සාහිත්‍ය ii. හයවන පරාක්‍රමබාහු රජතුමා
iii. ආර්ය චක්‍රවර්තීන් iv. කුරුණෑගල යුගයේ සාහිත්‍ය **(ලකුණු 08 බැගිනි)**

**C කොටස**

07. i. **උඩරට රාජ්‍ය ආක්‍රමණය කිරීමට පෘතුගීසින් පෙළඹවූ සාධක පරීක්ෂා කරන්න.** **(ලකුණු 08)**

ii. **එම ආක්‍රමණ අසාර්ථක වූයේ මන්ද?** **(ලකුණු 08)**

08. **එක්කෝ (A) කොටසට නැතහොත් (B) කොටසට පමණක් පිළිතුරු සපයන්න.**

**(A). සෝල්බරි ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න.** **(ලකුණු 16)**

**(B). 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලිකාංග පරීක්ෂා කරන්න.** **(ලකුණු 16)**

09. **පහත දැක්වෙන මාතෘකා අතුරෙන් දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබද කෙටි සටහන් ලියන්න.**

i. **1818** සටන

ii. **1956** මැතිවරණය

iii. **පෘතුගීසින් හා යාපන රාජධානිය**

iv. **අමද්‍යප ව්‍යාපාරය**

v. **1915** කෝලහාලය


**(ලකුණු 08) බැගින්)**

# (25) ශ්‍රී ලංකා ඉතිහාසය

(ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා)

II කොටස

1.



අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පෙරහුරු පරීක්ෂණය - 2020

General Certificate of Education (Adv. Level) Examination - Practice Test - 2020

ඉංදීය ඉතිහාසය II ( I කොටස)
History of India II (Part I)

25 A | S | II

කාලය : පැය තුනයි
Time : Three hours

**සැලකිය යුතුයි**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ.සියළුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

- **අංක 01 සිට 10 දක්වා එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දක්වා ඇත.ඒ අතුරින් එකක් කවර හේතුවක් නිසා හෝ අනෙක් නම් සමඟ නොගැලපේ.එම නොගැලපෙන නාමයට හිමි අංකය වරහන තුල ලියන්න.**

1. **(1)** සින්දු **(2)** බ්‍රහ්මපුත්‍ර **(3)** නර්මදා **(4)** බෝලාන් **(5)** ක්‍රිෂ්ණා (.....)

2. **(1)** හින්දුකුෂ් **(2)** කාර්ඩමන් **(3)** අරවල්ලි **(4)** කිර්තාර් **(5)** සුලෙයිමාන් (.....)

3. **(1)** මේඝදූතය **(2)** ප්‍රියදර්ශකා **(3)** නාගානන්ද **(4)** රත්නාවලි **(5)** හර්ෂචරිතය (.....)

4. **(1)** ශක **(2)** කුෂාණ **(3)** මෛත්‍රික **(4)** ඉන්දුග්‍රීක **(5)** පාර්තියන් (.....)

5. **(1)** රබිගාර් **(2)** රූපාර් **(3)** හරප්පා **(4)** චංහුදාරෝ **(5)** කනෞජ (.....)

6. **(1)** නාලන්දා **(2)** වලභි **(3)** වික්‍රමශිලා **(4)** ජුනාගාද් **(5)** ජගද්දලා (.....)

7. **(1)** තංජෝර් **(2)** පුරුෂපුර **(3)** කාංචි **(4)** මධුරෙරෙ **(5)** වාතාපි (.....)

8. **(1)** හර්යංක **(2)** සිසුනාග **(3)** නන්ද **(4)** මෞර්ය **(5)** චෝල (.....)

9. **(1)** ප්‍රයාග **(2)** සුප්පාරක **(3)** භාරුකච්ච **(4)** තාම්‍රලිප්ති **(5)** කාවේරි පටුන (.....)

10. **(1)** තාරානාථ **(2)** ඉට්සිං **(3)** සුංයුංග් **(4)** පාහියං **(5)** හියුංසාං (.....)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවලට පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

11. **1.** වත්ස - වෛශාලි　　**2.** කුරු - පංචාල
**3.** සූරසේන - මථුරා　　**4.** වජ්ජී - කෞශම්බි
**5.** අංග - චම්පා　　(.....)

12. **1.** මගධය - බිම්බිසාර　　**2.** උජ්ජේයිනි- චණ්ඩපජ්ජෝත
**3.** කාසි - බ්‍රහ්මදත්ත　　**4.** කෝසල - පසේනජිත්
**5.** අංග - සිසුනාග　　(.....)

13. **1.** මස්කි සෙල්ලිපිය - අශෝක　　**2.** ජුනාගාද් සෙල්ලිපිය - රුද්‍රදාමන්
**3.** අයිහෝල් සෙල්ලිපිය - II පුලකේෂින්　　**4.** හතිගුම්පා සෙල්ලිපිය - ඛාරවේල
**5.** නාසික් සෙල්ලිපිය - සමුද්‍රගුප්ත　　(.....)

14. **1.** කාලිදාස - දශකුමාර චරිතය　　**2.** භාස - ස්වප්නවාසව දත්තා
**3.** අශ්වඝෝෂ - සාරිපුත්‍රප්‍රකරණ　　**4.** පතංජලි- මහාභාෂ්‍ය
**5.** පාණිනි - අෂ්ටාධ්‍යායි　　(.....)

15. **1.** සෝම - දිව්‍යමය පානයකි　　**2.** ශුල්ක - රථාචාර්ය
**3.** මන්ත්‍රි පර්ෂද් - අමාත්‍ය මණ්ඩලය　　**4.** සමාහර්ත - ප්‍රධාන අයකැමි
**5.** සති - වැන්දඹුවන් දරසෑයට පැන මිය යාම.　　(.....)

- අංක **16** සිට **20** තෙක් එහි එක් එක් ප්‍රශ්නයෙහි නාම/ ප්‍රකාශන/ දින වකවානු සමූහයක් x හා y තීරුවල දි ඇත. Y තීරුවේ දි ඇති නාම/ප්‍රකාශන/දින වකවානු, x තීරුවේ දි ඇති ඒවා සමග කිසියම් ආකාරයට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ.y තීරුව , x තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙලට සකස් කළ විට පහත දි ඇති සංයෝග පහෙන් එකක් නිවරදිය. නිවරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.
-

16.

| X | Y |
|---|---|
| **1.** ගද්‍ය | A ගීතගෝවින්ද |
| **2.** පද්‍ය | B රාජතරංගනි |
| **3.** වෛද්‍ය | C කථාසරිත් සාගර |
| **4.** නාට්‍ය | D රත්නාවලි |
| **5.** වංශකථා | E අෂ්ටාංග සංග්‍රහය |

(1) ADCBE　(2) BEDCA　(3) CAEDB　(4) DBAEC　(5) CEBAD　　(.....)

17.

| X | Y |
|---|---|
| **1.** වලභි | A අධ්‍යාපන |
| **2.** අජන්තා | B රථ |
| **3.** මථුරා | C ලෙන් විහාර |
| **4.** මහබලිපුරම් | D බුද්ධ ප්‍රතිමා |
| **5.** තංජෝර් | E හින්දු දේවාල |

(1) ADCBE　(2) BEDCA　(3) CAEDB　(4) DBAEC　(5) CEBAD　　(.....)

18. X Y

**1.** යම A යුද්ධයට අධිපති දෙවියා

**2.** ඌෂස් B අහසට අධිපති දෙවියා

**3.** වරුණ C අරුණෝදයට අධිපති දෙවියා

**4.** ඉන්ද්‍ර D ගාන්ධර්වයන්ගේ භාර්යාව

**5.** අප්සරා E මරණයට අධිපති දෙවියා

(1) ADCBE (2) BEDCA (3) CAEDB (4) DBAEC (5) CEBAD **(.....)**

19. X Y

**1.** මිථිලා A විදේහ

**2.** කුසිනාරා B කෝලිය

**3.** වෛශාලි C ලිච්ඡවි

**4.** රාමගාම D මල්ල

**5.** පිප්ඵලි වනය E මෝරිය

(1) ADCBE (2) BEDCA (3) CAEDB (4) DBAEC (5) CEBAD **(.....)**

20. X Y

**1.** ඉන්ද්‍රප්‍රස්ථ A පෙෂාවෝර්

**2.** භාරුකච්ඡ B බ්‍රෝච්

**3.** පුරුෂපුර C පැට්නා

**4.** ප්‍රයාග D දිල්ලිය

**5.** පාටලිපුත්‍ර E අලහබාද්

(1) ADCBE (2) BEDCA (3) CAEDB (4) DBAEC (5) CEBAD **(.....)**

- අංක **21** සිට**25** තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා , ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

21. හරප්පා ශිෂ්ටාචාරයට අයත් වානිජ නගරය ලෙස හැඳුනාගෙන ඇති රඛිගාර් නගරයේ කැනීම් කල පුරාවිද්‍යාඥයකු වන්නේ පහත අය අතුරෙන් කවරෙක්ද?

**1.** මෝටිමර් වීලර් **2.** වසන්ත් සින්ඩේ **3.** ආර්.ඩී. බැනර්ජි

**4.** ජෝන් මාර්ෂල් **5.** දයාරම් ශානි **(.....)**

22. ඉන්දීය ඉතිහාසය හැදෑරීමට යොදාගත හැකි චරිතාපදානයක් ලෙස සැලකෙන හර්ෂ චරිතය නම් ග්‍රන්ථයේ කතුවරයා,

**1.** කල්හන **2.** භාණභට්ට **3.** බිල්හන

**4.** ජයසිංහ **5.**කෞටිල්‍යය **(.....)**

23. අවසන් මෞර්ය පාලකයා වු බෘහද්රථ මරා බලය පැහැරගත් සෙන්පතියා කවුද?

**1.** ඩිමෙට්‍රියස් **2.** නහාපාන **3.** කණිෂ්ක

**4.** මිනැන්ඩර් **5.** පුෂ්‍යමිත්‍ර ශුංග **(.....)**

24. මහායාන බෞද්ධ ග්‍රන්ථ රචනා කොට ඇති ප්‍රධාන භාෂාව කුමක්ද?

**1.** සංස්කෘතික **2.**පාලි **3.** මාගධි

**4.** මලයාලම් **5.** තෙලිගු **(.....)**

25. කාලිංගය මගධයට ඈදා ගත් මෞර්යය වංශික රජු වන්නේ,

**1.** බිංදුසාර **2.** බෘහද්රථ **3.** කුණාල

**4.** අශෝක **5.** චන්ද්‍රගුප්ත **(.....)**

- අංක **26** සිට30 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත.එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැලපේ .එය තෝරා ,ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

26. ඉන්දීය ඉතිහාසය හැදෑරීමට ඇති සාහිත්‍ය මූලාශ්‍ර,
 **1.** පුරාණ ග්‍රන්ථ වලින් උතුරු ඉන්දියානු රාජවංශ පිළිබඳව යම් දැනුමක් ලැබිය හැකිය.
 **2.** ඉන්දීය ඉතිහාසය හැදෑරීමට ඇති පැරණිතම මූලාශ්‍ර වන්නේ බෞද්ධ සාහිත්‍යයය.
 **3.** ක්‍රි.පූ. 6 වන සියවසෙන් පසු සියවස් කීපයක තොරතුරු ජෛන සාහිත්‍යයෙන් ලබාගත හැකිය.
 **4.** හර්ෂචරිතය ඇතුළු චරිතාපදානයන් ද ඉන්දීය ඉතිහාසය හැදෑරීමට යොදාගත හැකිය.
 **5.** සංගම් සාහාත්‍යය මඟින් දකුණු ඉන්දීය ඉතිහාසයට අදාල තොරතුරු ලබාගත හැකිය. (.....)

27. ඍග් වෛදික යුගය,
 **1.** මෙම යුගය පිළිබඳ තොරතුරු හමුවන ප්‍රධාන මූලාශ්‍රය බෞද්ධ සාහිත්‍යයයි.
 **2.** සමාජය පැවතියේ ගෝත්‍රික අවධියකය.
 **3.** අග්නි, ඉන්ද්‍ර, වරුණ, ප්‍රධාන දෙවිවරුය.
 **4.** වැසියාගේ ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය විය.
 **5.** සමාජය පීතෘ මූලික විය. (.....)

28. සමූහාණ්ඩු පාලන ක්‍රමය,
 **1.** ගණ හා සංඝ යන නම්වලින්ද හඳුන්වා ඇත.
 **2.** වත්ස හා අවන්ති ජනපදවල මෙම පාලන ක්‍රමය ක්‍රියාත්මක විය.
 **3.** මෙහි පාලනයට පාලකයන් 7707 ක් සිටිබව බෞද්ධ සාහිත්‍යෙයහි සඳහන් වේ.
 **4.** පාලකයන් විසින් සප්ත අපරිහාණිය ධර්ම අනුගමනය කරන ලදි.
 **5.** ප්‍රවේණි පුස්තකය අනුව අධිකරණ කටයුතු සිදුකරන ලදි. (.....)

29. මගධ රාජධානියේ නැඟීමට හා වර්ධනයට බලපෑ සාධක,
 **1.** රාජධානියේ හා අගනුවර භූගෝලීය පිහිටීම.
 **2.** කෘෂිකර්මාන්තයේ හා වෙළඳාමේ දියුණුව.
 **3.** සප්ත අපරිහාණිය ධර්ම අනුගමනය කල සමූහාණ්ඩු පාලනයක් පැවතීම.
 **4.** දක්ෂ පාලකයන් යටතේ සංවිධානය වූ හමුදාව.
 **5.** සම්පත්වලින් ආඪ්‍ය වීම. (.....)

30. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ නගර සැලැසුම් හා නාගරික ලක්ෂණ,
 **1.** මොහෙන්ජෝදාරෝ සහ හරප්පා යන නගර දෙක ප්‍රධාන නගර දෙක ලෙස සැලකුණි.
 **2.** පළල් වූ ඍජු මාර්ග තිබුණි.
 **3.** ප්‍රධාන මාර්ග දෙපසින් විධිමත් කානු පද්ධතියක් තිබී ඇත.
 **4.** මාර්ග හා කාණු ඉදිකිරීමේදි කලුගල් භාවිතා කර ඇත.
 **5.** ප්‍රධාන නගර ආශ්‍රිතව මහල් නිවාස ඉදිකර ඇත. (.....)

- අංක 31 සිට 35 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දි ඇති (A) , (B), (C) හා (D) යන ප්‍රතිචාර හතර අත්රෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවරදිය. නිවරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරන්න.
 (A) සහ (B) පමණක් නිවරදි නම් ............................................ 1 ද,
 (B) සහ (C) පමණක් නිවරදි නම් ............................................ 2 ද,
 (C) සහ (D) පමණක් නිවරදි නම් ............................................ 3 ද,
 (A) සහ (C) පමණක් නිවරදි නම් ............................................ 4 ද,
 ප්‍රතිචාර එකක් හෝ දෙකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවරදි නම් ..... 5 ද වරහන් තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) හා (B) පමණක් නිවරදිය | (B) හා (C) පමණක් නිවරදිය | (C) හා (D) පමණක් නිවරදිය | (A) හා (C) පමණක් නිවරදිය | ප්‍රතිචාර එකක් හෝ දෙකට වැඩි සංඛ්‍යාවක් නිවරදිය |

31. ඉන්දිය ඉතිහාසය හැදැරීමේදි යොදාගන්නා සෙල්ලිපි,
(A). ඉන්දියාවේ සැම රජ කෙනෙකුම සෙල්ලිපි නිකුත් කර ඇත.
(B). සෙල්ලිපි රජවරුන්ගේ බල ව්‍යාප්තිය හඳුනාගැනිමට උපකාරි වේ.
(C). ප්‍රස්තුත කාල පරිච්ඡේදවල ලේඛන ක්‍රමවේද පිළිබද අදහසක් ලබාගත හැකිය.
(D). සෙල්ලිපි නිතරම සත්‍ය හා නිවැරදි තොරතුරු සපයයි. (.....)

32. හරප්පා නගරය
(A). නගරයේ සැම ඉදිකිරිමක් සඳහාම යොදාගෙන ඇත්තේ සකස් කරන ලද කලුගල්ය.
(B). නගරයේ නිවාස වල දොරටුව තබා ඇත්තේ ප්‍රධාන මාර්ගයට මුහුණලාය.
(C). නගරයේ කාර්යක්ෂම ජලය බැසයන ක්‍රමයක් පැවතිණි.
(D). විථි අලෝකමත් කිරිම සඳහා පහන් කණු සිටුවා ඇත. (.....)

33. ජෛන ආගම,
(A). ජෛන ආගමේ නිර්මාතෘවන්නේ වර්ධමාන මහාවීරය.
(B). මහවීරතුමා ගිහිගෙය අතහැර ගොස් ජීන හෙවත් නිගණ්ඨ බවට පත්විය.
(C). ජෛනාගමේ නිකායන් හෝ බෙදීම් දැකිය නොහැකිය.
(D). ජෛනයෝ මහායාග පැවැත්වුහ. (.....)

34. නන්ද රාජවංශය,
(A). නන්ද රජවරුන්ගේ පාලන මධ්‍යස්ථානය වුයේ පුරුෂ පුරයයි.
(B). එම පෙළපතේ නායකයා මහපද්ම නන්ද රජුය.
(C). නන්ද රජවරු යටතේ උතුරු ඉන්දියාවේ විශාල ප්‍රදේශයක බලය ව්‍යාප්තව පැවතුණි.
(D). ධනනන්ද එම පෙළපතේ අවසාන පාලකයාය. (.....)

35. මෞර්ය අධිරාජ්‍යයේ පරිහානියට බලපෑ හේතු,
(A). අවසන් භාගයේ දුර්වල පාලකයන් බලයට පත්වීම.
(B). කාලිංග යුද්ධයෙන් ලත් පරාජය
(C). විදේශ ආක්‍රමණ හා දේශපාලන ඒකාබද්ධතාවය බිඳයාම.
(D). අශෝක රජුගේ ආගම් විරෝධි කටයුතු. (.....)

- අංක බැගින් අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක දී ඇත.එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොදින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1,2,3,4** හා **5** යන කවර විග්‍රහය දැයි තෝරා ඊට ආදාළ අංකය වරහන තුළ ලියන්න.

| | පළමු වැනි ප්‍රකාශය | දෙවෙනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | නිවැරදි ය. |
| 4 | වැරදි ය. | වැරදි ය. |
| 5 | නිවැරදි ය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 36. අර්ථශාස්ත්‍රය දේශපාලන න්‍යාය ධර්ම ඇතුලත් ග්‍රන්ථයකි. | සංගම් සාහිත්‍ය පාණ්ඩ්‍ය රජවරුන්ගේ අනුග්‍රහයෙන් ලියා ඇත. **(.....)** |
| 37. මව්දෙවඟන පිදීම ඉන්දු නිම්නයේ පැවති ප්‍රධාන ආගමික ඇදහිල්ලයි. | ඉන්දුනිම්නයෙන් හමුවූ මුද්‍රවලින් ඒ බව තහවුරු වී ඇත. **(.....)** |
| 38. ඍග් වෛදික යුගයේදි වැන්දඹුවන් දර සෑයට පැන මියයාමේ සති පූජාව පැවතුණි. | පශ්චාත් වෛදික යුගයට අදාල තොරතුරු ලබාගත හැක්කේ ඍග් වේදයෙනි. **(.....)** |
| 39. බෞද්ධ සාහිත්‍යයට අනුව චන්ද්‍රගුප්ත මෞර්ය පහත් කුලයකට අයත් වේ. | නන්ද පෙළපතේ අවසන් රජු මරා චන්ද්‍රගුප්ත මෞර්ය බලයට පත්විය. **(.....)** |
| 40. "සියලුම මිනිසුන් මාගේ දරුවෝය."යනුවෙන් අශෝක රජු ධෞලි ගිරි ලිපියේ දක්වා ඇත. | බුදුදහම වැලද ගැනීමෙන් පසු  අශෝක රජු සෙසු ආගම් මර්ධනය කළේය. **(.....)** |

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පෙරහුරු පරීක්ෂණය - 2020
## General Certificate of Education (Adv. Level) Examination - Practice Test - 2020

**ඉංදීය ඉතිහාසය II ( II කොටස)**
History of India II (Part II)

25 A | S | II

**සැලකිය යුතුයි.**
- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **B හා C කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න එක බැගින් තෝරාගෙන ප්‍රශ්න තුනකට ද පිළිතුරු සපයන්න. (පළමුවන ප්‍රශ්නයට පිළිතරු සැපයීම සඳහා ඉන්දියාවේ දළ සිතියමක් සපයා ඇත.)**

### A කොටස

01. **ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම කරන්න.**

**1.** මොහෙන්ජෝදාරෝ **2.** පුරුෂපුරය **3.** ක්රිෂ්ණා නදිය **4.** කාවේරි පටුන
**5.** භාරුකච්ඡ **6.** මථුරා **7.** අමරාවති **8.** මගධය
**9.** සුලෙයිමාන් කඳු වැටිය **10.** මක්‍රාන් දුර්ගය **11.** අවන්ති **12.** ථාර් කාන්තාර

**(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි)**

### B කොටස

02. **ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ආරම්භය හා පරිහානිය පිළිබඳව පරික්ෂා කරන්න. (ලකුණු 16)**

03. **ඍග් වෛදික යුගයේ ආගමික තත්වය පශ්චාත් වෛදික යුගයෙන් වෙනස් වූ ආකාරය විචාරාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 16)**

04. **"මෞර්ය අධිරාජ්‍යය ඉන්දීය ඉතිහාසයේ ස්වර්ණම යුගයයි."**
   i. **මෞර්ය වංශයේ ප්‍රථම පාලකයා කවරෙක්ද? (ලකුණු 01)**
   ii. **මෞර්යය අධිරාජ්‍යය පිළිබඳ හැදෑරීමට ඇති ප්‍රාථමික මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02)**
   iii. **චන්ද්‍රගුප්ත මෞර්යය අධිරාජ්‍යයාගේ දේශපාලන කාර්ය සංසිද්ධිය සැකෙවින් දක්වන්න. (ලකුණු 05)**
   iv. **මෞර්යය අධිරාජ්‍යය සමයේ ඉන්දියාවේ පැවතුණු දේශපාලන සහ ආර්ථක තත්වය පරික්ෂා කරන්න. (ලකුණු 08)**

05. **පහත දැක්වෙන මාතෘකා අතුරෙන් දෙකක ඓතිහාසික වැදගත්කම පරීක්ෂා කරන්න.**
   i. **ගංගා පද්ධතියේ පිහිටීම.** ii. **මගධ අධිරාජ්‍යයේ වර්ධනය.**
   iii. **ක්‍රි.පූ. හයවන සියවසයේ ආගමික තත්වය.** iv. **අශෝක සෙල්ලිපි. (ලකුණු 08 බැගිනි)**

### C කොටස

06. **කුෂාණ රාජ්‍ය අවධියේ සිටි පාලකයන් අතුරින් කනිෂ්ක රාජ්‍ය සමයේ වැදගත්කම පහත දැක්වෙන මාතෘකා ඇසුරින් සාකච්ඡා කරන්න.**
   i. **දේශපාලන කාර්ය සංසිද්ධිය** ii. **සංස්කෘතික අභිවර්ධනය (ලකුණු 16)**

07. **ගුප්ත රාජ්‍ය අවධියේ පාලකයන් අතුරින් සමුද්‍රගුප්ත රාජ්‍ය අවධිය වැදගත් වන ආකාරය මූලාශ්‍ර ඇසුරින් විමර්ශනය කරන්න.** **(ලකුණු 16)**

08. i. **ත්‍රෛපාක්ෂික අරගලය සම්බන්ධ රාජවංශය නම් කරන්න.** **(ලකුණු 03)**

ii. **ත්‍රෛපාක්ෂික අරගලය සම්බන්ධ රජවරුන් තිදෙනෙක් නම් කරන්න.** **(ලකුණු 03)**

iii. **ත්‍රෛපාක්ෂික අරගලයට බලපාන ලද හේතු විස්තර කරන්න.** **(ලකුණු 03)**

iv. **ත්‍රෛපාක්ෂික අරගලයේ ප්‍රතිඵල විස්තර කරන්න.** **(ලකුණු 07)**

09. **පහත දැක්වෙන මාතෘකා අතුරෙන් දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබද කෙටි සටහන් ලියන්න.**

i. **පල්ලව සංස්කෘතිය.** ii. **ශුංග රාජවංශය.**

iii. **ගුප්ත යුගයේ සාහිත්‍යය.** iv. **සංගම් සාහිත්‍යයේ වැදගත්කම.**

**(ලකුණු 08 බැගිනි)**

# (25 A) ඉන්දීය ඉතිහාසය

**(ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා)**

**II කොටස**

1.

